**බදු අභියාචනා කොමිෂන් සභාව - 2014**

**-----------------------------------------------**

බදු අභියාචනා කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන් ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

## 2.1 මතය

**--------**

මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට බදු අභියාචනා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන සමඟ ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව අත්පත් කර ගත් වත්කමක් පරිහරණය සඳහා සුදුසු තත්ත්වයට පත්වූ දිනයේ සිට ක්ෂය කළ යුතු වුවත් සභාව විසින් ඊට අනුකූල නොවන පරිදි වත්කම් මිල දී ගන්නා වර්ෂයේ දී ක්ෂය නොකරන පරිදි ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය සකසා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පිරිවැය රු.5,372,022 ක් වූ යන්ත්‍ර, ලී බඩු සහ කාර්යාල උපකරණ වාර්ෂිකව සියයට 10 ක අනුපාතය යටතේ ක්ෂය කිරීමට සභාව විසින් ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණ ද එහි දී වත්කම්වල ආයු කාලය පිළිබඳ අවධානය යොමු කර ක්ෂය අනුපාතය තීරණය කිරීමට අවධානය යොමුවී නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශන තුල සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු සඳහා වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.

## 2.3 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිසමේ මූල්‍ය ප්‍රතිඵලය රු.16,236,558 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,274,185 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,510,743 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ආයතන සහ පරිපාලන වියදම් රු.4,155,684 කින් වැඩිවී තිබුණ ද භාණ්ඩාගාර ප්‍රදානය රු.26,673,053 කින් වැඩිවී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට මූලිකවම බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

-------------------

2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභා පනතින් බදු අභියාචනා කොමිෂන් සභාව ස්ථාපිත කර තිබුණු අතර යම් බද්දක්, ගාස්තුවක් හෝ දණ්ඩනයක් හා අදාළ කාරණාවක් සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා දෙනු ලබන යම් තීරණයකින් අතෘප්තියට පත් වන යම් තැනැත්තෙකුට කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැකි අතර එසේ ලැබෙන අභියාචනා කොමිෂන් සභාව විසින් විභාග කර නිශ්චය කිරීම කළ යුතු ය. විගණනයට ලබාගත් තොරතුරු අනුව, 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සභාවට ඉදිරිපත් කළ අභියාචනා ප්‍රමාණය 166 ක් වූ අතර ඉන් නිශ්චය කළ අභියාචනා ගණන 138 ක් පමණක් වූයෙන් අභියාචනා 28 ක් නිශ්චය කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ දී ලැබුණු අභියාචනා 43 න් අභියාචනා 39 ක් එනම් සියයට 91 ක් නිශ්චය කර නොතිබුණි. මේ අනුව, සභාව විසින් ප්‍රමාණවත් කාර්යසාධනයක් පෙන්වා ඇති බවක් නිරීක්ෂණය නොවීය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව ස්ථාපිත කර ඇති 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභා පනතෙහි කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ විගණනය සම්බන්ධයෙන් වන විධිවිධාන ඇතුළත් ව නොතිබුණි. ඒ අනුව අදාළ විධිවිධාන ඇතුළත් කර පනත සංශෝධනය කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) අභියාචනා කරනු ලබන මුදලට අදාළ ව බදු කරුගෙන් අය කළ සියයට 10 ක තැන්පතු මුදල් ද, පවරා ගන්නා ලද බැංකු ඇපකර මුදල් ද හා අභියාචනයක් මත අය කරන රු.2,500 ක ගාස්තුව ද ඇතුළත් එකතුව රු.112,740,599 ක ශේෂයක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ තැන්පතු ලෙසත් ජංගම වගකීම් යටතේ ණයහිමියන් ලෙසත් දක්වා තිබුණි. එහෙත් මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් සටහන් තුළ මෙම ශේෂය සම්බන්ධයෙන් හෙලි දරව් කිරීමක් කර නොතිබුණි.

(ඇ) පනතේ විධි විධාන පරිදි බදු කරුවකු විසින් අභියාචනයක් ඉදිරිපත් කිරීමේ දී, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් නිකුත් කර ඇති තක්සේරු වටිනාකමින් සියයට 25 කට සමාන බැංකු ඇපකරයක් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර නිශ්චය ලබා දී බද්ද තහවුරු වූ විට එය සභාවට පවරා ගැනීම සිදු කරයි. සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට නිශ්චය නොකළ අභියාචනාවලට අදාළ ව කොමිෂන් සභාව සතු පවරා නොගත් බැංකු ඇපකර පිළිබඳව තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ වුවත් කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 15 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඞී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 වගන්තිය ප්‍රකාර ගිණුම් ඉදිරිපත් කිරීමේ වගකීම පිළිබඳ සහතිකය මූල්‍ය ප්‍රකාශනවල සඳහන්ව නොතිබුණි.

**5.2 සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම**

2003 ජුනි 2 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව සභාව විසින් සංයුක්ත සැලැස්මක් සහ සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ ව වරින් වර බඳු අභියාචනා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ අවධානයට යොමු කරන ලදි. පොත් පත්, වාර්තා හා ලේඛන පවත්වා ගෙන යාමේ අඩුපාඩු ලෙස ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොගැනීම, ලෙජර ගිණුම් විධිමත්ව පවත්වා නොතිබීම, අභියාචනා තැන්පතු හා ඇපකර පිළිබඳ ප්‍රමාණවත් වාර්තා පවත්වා නොගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.